**ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය - 2020**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ ("මණ්ඩලය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2019 අංක 23 දරණ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ (සංස්ථාපිත) පනතේ 10(3) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්එම්එම්ඊ සඳහා වන එස්එල්එෆ්ආර්එස්) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්එම්එම්ඊ සඳහා වන එස්එල්එෆ්ආර්එස්) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය

කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් හඳුනා ගැනීමට සහ වාර්ෂික සත්‍යාපනය කිරීමට හැකි වන පරිදි මණ්ඩලය සිය ස්ථාවර වත්කම් සංකේතනය කර නොතිබුණි. තවද, 2020 වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණ ද සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද රු.7,651,673 ක් වටිනා ස්ථාවර වත්කම් වල හිමිකාරිත්වය සහ භෞතික පැවැත්ම කෙෙරහි විගණනයේදී විශ්වාසය තැබිය නොහැකි විය. | 2021/2022 විගණන වර්ෂය තුළදී සමීක්ෂණ මණ්ඩලයක් පත් කර නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ. | ස්ථාවර වත්කම් නඩත්තු කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුයි. |

**1.5.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්එම්ඊර් සඳහා වන එස්එල්එෆ්ආර්එස්) අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආසන්න වශයෙන් රු. 3,965,061 ක පිරිවැයකින් යුත් පරිගණක අයිතම්, පරිගණක මෘදුකාංග, කාර්යාලීය ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ වැනි සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්, එම වත්කම් වල ඵලදායි ආර්ථික ආයු කාලය නැවත ඇගයීම් නොකර හා එස්එම්ඊර් සඳහා වන එස්එල්එෆ්ආර්එස් හි 10.15 සිට 10.18 දක්වා වූ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඒවා ගිණුම්ගත කිරීමකින් තොරව මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලැබේ. තවද, මේ සඳහා නිසි ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තියක් ද ස්ථාපිත කර නොතිබුණි. මේ අතර, මණ්ඩලයට අයත් ප්‍රොජෙක්ටරයක් සහ ශීතකරණයක් මෙම වාර්තාවේ දිනය දක්වාම ඇගයීම් කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන විත් නොතිබුණි. | 2021/2022 විගණන වර්ෂය තුළදී සමීක්ෂණ මණ්ඩලයක් පත් කර නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ඵලදායි ආර්ථික ආයු කාලය නැවත ඇගයීම් කර එපරිදි තක්සේරු කිරීමේ දෝෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) පෙර වර්ෂයේ දෝෂවල ශුද්ධ බලපෑම වන රු. 456,755 ක් එස්එම්ඊර් සඳහා වන එස්එල්එෆ්ආර්එස් හි 10.21 සිට 10.23 දක්වා වගන්ති වල අවශ්‍යතා අනුව ගැළපීම් කර හෙළිදරව් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදමට බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණු අතර පරිපාලන වියදම් සමාන මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | අනාගතයේ දී එස්එම්ඊර් සඳහා වන එස්එල්එෆ්ආර්එස් හි 10.21 සිට 10.23 දක්වා වගන්තියේ අවශ්‍යතා අනුව පෙර වර්ෂයන්ට අදාළ දෝෂ නිවැරදි කිරීම් කර හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන වල සාවද්‍ය ප්‍රකාශයන් වැළැක්වීම සඳහා ප්‍රමිති වල සඳහන් විධිවිධාන වලට අනුකූලව පෙර වර්ෂයේ දෝෂ නිවැරදි කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණය විසින් විගණනය සඳහා ලබා දුන් පැහැදිලි කිරීම අනුව 2020 දෙසැම්බර් 31 දිනට වූ රු. 4,229,405 ක හිඟහිටි මුළු ණයගැති ශේෂයෙන් රු. 730,500 ක හිඟහිටි ණයගැති ශේෂය අයකර ගැනීමට නොහැකි බව හෙළිදරව් විය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් මූල්‍ය | මුදල් කමිටුවේ වාරික රැස්වීම සහ එස්ජී/ ප්‍රධාන විධායක නිලධාරියාගේ රැස්වීම් වලට අනුව, එකතු කිරීමට නොහැකි ණය ආපසු හැරවීමට හෝ කපා හැරීමට යොමු කෙරේ. මෙම ක්‍රියාවලිය අපි දේශීය ආදායම් | වෙළඳ ණය ගැතියන් හා ලැබිය යුතු ගිණුම් හානිකරණය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති යක් මණ්ඩලය විසින් ස්ථාපිත කර හෙළිදරව් කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රකාශන වල හානිකරණය සඳහා විධිවිධාන සලසා නොතිබුණි. තවද, වෙළඳ ණය ගැතියන් හා ලැබිය යුතු ගිණුම් වෙනුවෙන් හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මණ්ඩලය විසින් ස්ථාපිත කර හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව (IRD) සමඟ ද අනුගමනය කරමු. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩියෙන් ගෙවන ලද රු.346,371 ක එකතු කළ අගය මත බද්ද (වැට) නිසි පරිදි ගැලපීම් කිරීම් වෙනුවට සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී ගෙවිය යුතු ගිණුම් වලට එරෙඑහිව හිලව් කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු දේ හා ජංගම වත්කම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ලෙස පෙන්වා තිබූ රු.229,792 ක තවත් ශේෂයක් නිරවුල් කිරීම සඳහා කිසිදු පියවරක් නොගෙන පසුගිය අවුරුදු දෙකක කාලයක සිට ලැබිය යුතු මුදල් ලෙස පෙන්වා තිබුණි. | වැඩිපුර ගෙවන ලද වැට් බද්ද වෙනත් ගෙවිය යුතු ගිණුම් වලට එරෙහිව ගැලපීම් නොකර අනාගතයේදී ජංගම වත්කම් යටතේ පෙන්වනු ඇත. සඳහන් කර ඇති රඳවා ගැනීමේ බදු ඉදිරි වර්ෂයේදී නිරවුල් කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහතික කිරීම පිණිස හර ශේෂයන් බැර ශේෂයන්ට එරෙහිව හිලව් නොකර ඒවා වෙනම දැක්විය යුතුය. |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතීන් ලබා නොගෙන, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.769,469 ක් වූ ලැබිය යුතු ගිණුම් අතිරික්තයට එරෙහිව කපා හැර තිබුණි. | විගණන විමසුම සඳහා පිළිතුරු සැපයීමේදී කපා හරින ලද රු.769,469 ක පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන ලදී. | ලැබිය යුතු ගිණුම් කපා හැරීමට පෙර අදාළ බලධාරීන්ගෙන් නිසි හා අවශ්‍ය අනුමැතීන් ලබා ගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2019 අංක 23 දරණ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩල (සංස්ථාපිත) | මෙම පනත ආරම්භ වූ දින සිට වසරක් ඇතුළත මණ්ඩලයේ පළමු කළමනාකරණ මණ්ඩලය පත් කිරීම හෝ තෝරා පත් කර ගත යුතුය. කෙසේ | වාර්ෂික මහා සභා රුස්වීම් පැවැත්වීම සඳහා පෙර වර්ෂයේ විගණනය කළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. එබැවින් 2020 වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් ලැබීමෙන් පසු ඉහත ගැටලුව | සංස්ථාපිත පනතේ ඇති විධිවිධාන වලට අනුකූල වීම සඳහා මණ්ඩලයේ කළමනාකාරිත්වය කාලානුරූපිතව |

| | | | |
|---|---|---|---|
| පනතේ 05 (2) (ඇ) වගන්තිය | වෙතත්, 2021 මැයි 31 දක්වාත් එසේ කිරීමට මණ්ඩලය කටයුතු කර නැත. | නිරාකරණය වන අතර වාර්ෂික මහා සභා රුස්වීම්ද පවත්වනු ඇත. | කටයුතු කළ යුතුය. |
| (ආ) 2007 අංක 07 දරණ සමාගම් පනතේ 319 ඡේදය. | මණ්ඩලය සංස්ථාපිත කිරීමට පෙර, මෙම මණ්ඩලය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ වගකීමෙන් සීමා වූ සමාගමක් ලෙස ක්‍රියාත්මක වී තිබුණි. කෙසේ වුවද, එකී වසා දැමීමේ ක්‍රියාවලිය මෙම වාර්තාවේ දිනය දක්වාම අවසන් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මීට පෙර වගකීමෙන් සීමා වූ සමාගමක් ලෙස ක්‍රියාත්මක වී තිබූ මෙම ආයතනයේ (සීසීඅයිඑස්එල්) වසා දැමීමේ කටයුතු අපගේ සමාගම් ලේකම් ලෙස කටයුතු කළ උපදේශක සේවා (පුද්ගලික) සමාගම වෙත පවරන ලද අතර එම සමාගම අදාළ විස්තර ඇතුලත් අයදුම්පත 2021 අප්‍රේල් මස මුල් සතියේදී සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර ඇත. | සමාගම් පනතේ ඇති විධිවිධාන වලට අනුකූල වීම සඳහා මණ්ඩලයේ කළමනාකාරිත්වය කාලානුරූපීතව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 19,138,967 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් මාස 09 ක කාල පරිච්ඡේදයේ ඌනතාවය රු. 5,138,109 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 24,277,076 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා ගොඩනැගීම් ප්‍රදර්ශනයෙන් ලද ආදායම රුපියල් 33,917,821 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා සුදුසුකම් ලත් හා ස්ථිර සේවක පිරිසක් බඳවා ගැනීමට අවශ්‍ය අනුමත සේවක සංඛාවක් හා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාපටයක් මණ්ඩලය සතු නොවීය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 වන විට මණ්ඩලයේ තත්‍ය සේවක සංඛ්‍යාව 17 ක් වූ අතර මෙම සමස්ථ කාර්ය මණ්ඩලයම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමස්ත කාර්ය මණ්ඩලයේම කොන්ත්‍රාත් කාලය අවසන් වී තිබුනත්, මෙම වාර්තාවේ දිනය දක්වාම මේ සම්බන්ධයෙන් මණ්ඩලය කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | නිරීක්ෂණය සටහන් කරන ලද අතර සේවා ගිවිසුම් කාලය සහ පුද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට පෙර බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට මණ්ඩලය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මානව හා මූල්‍ය සම්පත් කළමනාකරණයට අදාළ සියළුම කරුණු සම්බන්ධ රීති හා රෙගුලාසි ඇතුලත් ක්‍රියාපටිපාටියක් සහ මූල්‍ය අත්පොතක් තිබිය යුතු වුවත්, මණ්ඩලයේ මානව හා මූල්‍ය සම්පත් බාධාවකින් තොරව හා ඵලදායි ලෙස පාලනය කිරීම සඳහා එවැනි මගපෙන්වීමේ අත්පොත් කිසිවක් මණ්ඩලය සතුව නොතිබුණි. | අදහස් දැක්වීම් කර නොතිබුණි. | මණ්ඩලයේ මානව හා මූල්‍ය සම්පත් බාධාවකින් තොරව හා කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා මගපෙන්වීම් අත්පොතක් සහ මූල්‍ය අත්පොතක් ඇති කර ගැනීමට මණ්ඩලය අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.2 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ බැංකු ජංගම ගිණුමක් මගින් 2020 මාර්තු 02 දින නිකුත් කරන ලද රු. 50,000 ක් වටිනා කල් ඉකුත් වූ චෙක්පතක් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අදාළ ගනුදෙනුව සොයා ගැනීමට අපට ප්‍රමාණවත් යොමු කිරීම් හා හඳුනාගැනීම් සපයා නොතිබුණු හෙයින්, මේ සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ කිරීමට නොහැක. | නිකුත් කළ දින සිට මාස හයකට වැඩි කාලයක් චෙක්පතක් මුදල් නොකර තිබුනහොත්, එවැනි චෙක්පත් අවලංගු කරනු ලැබුවා සේ සලකා එපරිදි ගිණුම්වල සටහන් කළ යුතුය. |